සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/SS/2/VII/3/2025-2
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2025.07.21

**සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2025/10**

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරු /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරු,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

සියළුම විෂය භාර නිලධාරින් / සමෘද්ධි සංවර්ධන නිලධාරින්,

**අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලැබූ සමෘද්ධි ප්‍රතිලාභින් පවුල්වල උසස් පෙළ හදාරන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනට අදාලව වාරික මුදල් සෘජු ප්‍රේෂණ මඟින් සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වලට බැර කිරිම.**

**01. පසුබිම හා අරමුණු**

i. සමාජ සංවර්ධන භාරකාර මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සමෘද්ධි ප්‍රතිලාභ හිමිව තිබූ අස්වැසුම ප්‍රතිලාභ සඳහා තේරී පත් නොවූ පවුල් වල උසස් පෙල හදාරන දරුවන් වෙනුවෙන් සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල මඟින් ක්‍රියාත්මක වේ.

ii. මේ වන විට 2023-2025 අධ්‍යයන වර්ෂය හා 2024-2026 අධ්‍යයන වර්ෂය සඳහා සිප්දොර ශිෂ්‍යත්ව වාරික ගෙවීම් සිදු කරනු ලබයි. මෙම සිප්දොර ශිෂ්‍යත්ව වාරික මුදල් කලට වේලාවට දරුවන් වෙත ලබා දීම සඳහා නිසි චක්‍රලේඛ උපදෙස් ලබා දී තිබුණද, නිසි කලට වේලාවට නිවැරදි තොරතුරු නොලැබෙන අවස්ථා ඇතැම් දිස්ත්‍රික්ක වල දක්නට ලැබේ.

iii. ඒ අනුව සිදුවන හිඟ වාරික එකවර ගෙවීම, වාරික ප්‍රමාද කර ගෙවීම හා මුදල් ඉතිරි වී ආපසු එවීම වැනි සිදුවීම් නිසා මුදල් ප්‍රවාහය නිසි පරිදි පවත්වාගෙන යාමට, මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට හා දරුවන් වෙත වාරික මුදල් කලට වේලාවට නොලැබීම හේතුවෙන් මෙම වැඩසටහනේ අරමුණු ඉටු නොවීමට ද දැඩි ලෙස බලපායි.

iv. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහනේ අරමුණු ඉටු කරවා ගැනීම හා සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කටයුතු විධිමත්ව පරිපාලනය හා කළමනාකරණය කර ගැනීම සඳහා දිස්ත්‍රික්ක වලින් සමෘද්ධි බැංකු මට්ටමින් තොරතුරු ගෙන්වා ගෙන සෘජුවම සමෘද්ධි බැංකුවලට අදාල වාරික මුදල් ප්‍රේෂණය කර ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වලට කලට වේලාවට බැර කිරීමට භාරකාර මණ්ඩලය උපදෙස් ලබාදෙන ලදී.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

**02. ඍජු ප්‍රේෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.**

i. දැනට ක්‍රියාත්මක අධ්‍යයන වර්ෂය දෙකට අදාලව මේ දක්වා ක්‍රියාත්මක වූ පරිදි වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් තහවුරු කර ගනු ලබන ශිෂ්‍යාත්වලාභින්ගේ තොරතුරු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතු අතර ප්‍රතිලාභි දරුවන්ගේ නම, ගිණුම් අංකය ඇතුලත් තොරතුරු අදාල බැංකු කලාපය වෙත යොමු කළ යුතුය.

ii. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත කලාප මට්ටමින් ලැබෙන තොරතුරු විධිමත් අනුමැතිය යටතේ දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කල යුතුය. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුපිළිවෙල හා සමෘද්ධි බැංකු අනුපිළිවෙලට දිස්ත්‍රික් කාර්යාල වෙත, විද්‍යුත් තැපැල මගින් මේ සමඟ යොමු කරන ආකෘතියට (Excel file), අදාල තොරතුරු ඇතුලත් කර ssfsamurdhi@yahoo.com විද්‍යුත් තැපැල ඔස්සේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම සිදු කල යුතුය. එහි මුද්‍රිත පිටපත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ගේ අත්සනින් යුතුව ප්‍රධාන කාර්යාලය වෙත යොමු කල යුතුය.

iii. එමෙන්ම සිප්දොර ශිෂ්‍යාත්ව වාරික මුදල් ඉල්ලුම් කිරීමේදී මෙතෙක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලද සාරාංශ වාර්තා (ඇමුණුම-02) අධ්‍යයන වර්ෂයන් අනුව වෙන වෙනම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව යොමු කල යුතුය.

iv. දිස්ත්‍රික්ක වලින් සමෘද්ධි බැංකු මට්ටමින් ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන තොරතුරු පදනම් කරගෙන සිප්දොර ශිෂ්‍යාත්ව වාරික මුදල් අදාල සමෘද්ධි බැංකු ජංගම ගිණුමට බැර කරනු ලබයි.

v. ඒ අනුව අදාල සමෘද්ධි බැංකුව සිප්දොර ශිෂ්‍යාත්ව හිමි ප්‍රතිලාභි දරුවන්ගේ ගිණුම වෙත වාරික මුදල බැර කිරීම සිදු කරනු ඇත.

vi. ප්‍රතිලාභි දරුවාගේ ගිණුමට වාරික මුදල් බැර වීමත් සමඟ ප්‍රතිලාභියාගේ ජංගම දුරකථනයට කෙටි පනිවිඩයක් මඟින් දැනුම් දීම සිදු කෙරේ. එබැවින් මේ සම්බන්ධයෙන් ප්‍රතිලාභියා දැනුවත් කර, ප්‍රතිලාභියාගේ දුරකථන අංකය අදාල සමෘද්ධි බැංකුව මඟින් හෝ වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරියා මඟින් දත්ත පද්ධතියට ඇතුලත් කල යුතු වේ.

vii. 2025-2027 නව අධ්‍යයන වර්ෂයේ උසස් පෙල පංති ආරම්භ වූ පසු සිප්දොර ශිෂ්‍යාත්ව වැඩසටහන සඳහා නව සිසුන් බඳවා ගැනිමට අදාල චක්‍රලේඛ කඩිනමින් ඔබ වෙත යොමු කිරිමට අපේක්ෂිත අතර, එම සිසුන්ගේ තොරතුරුද ප්‍රධාන කාර්යාලයට එවීමේ දී ද මෙම චක්‍රලේඛ උපදෙස් භාවිතා කල යුතුය.

03. එක් එක් දිස්ත්‍රික්කයන්ට අයත් සමෘද්ධි බැංකු සංඛ්‍යාව පදනම් කරගෙන ඉදිරි මාස 05 සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළ දී ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක්ද කඩිනමින් ඔබ වෙත ලබා දීමටද කටයුතු කරනු ලැබේ.

04. මෙම සිප්දොර ශිෂ්‍යාත්ව වාරික ගෙවීම් වලට අදාල ගිණුම් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් විධිමත් උපදෙස් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි බැංකු වෙත ඉදිරියේ දී ලබා දෙනු ඇත.

05. ඉහත ක්‍රමවේදය අනුව සිප්දොර ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීම 2025 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කිරීම පහත කාල රාමුව තුල සිදු කිරිමට කටයුතු කල යුතු වේ.

| | |
|---|---|
| i. වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින් දැනට ක්‍රියාත්මක වන අධ්‍යයන වර්ෂයන්ට (2023-2025 / 2024-2026) අදාලව සිප්දොර ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා අදාල සමෘද්ධි බැංකු සංගමය වෙත යොමු කිරීම. | පෙර මස හතරවන සතිය අවසන් වීමට පෙර |
| ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසම් මට්ටමින් ලබාගත් තොරතුරු සමෘද්ධි බැංකු මට්ටමින් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කිරීම. | සෑම මසකම පලමු සතිය තුල |
| iii. දිස්ත්‍රික් වෙත සමෘද්ධි බැංකු මට්ටමින් ලබාදෙන තොරතුරු ප්‍රධාන කාර්යාලය ලබා දුන් Excel Sheet භාවිතයෙන් ඇතුලත් කිරීම හා මෘදු පිටපත ප්‍රධාන කාර්යාලය වෙත විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කිරීම. මුද්‍රිත පිටපතේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම. | සෑම මසකම දෙවන සතිය තුල |
| iv. ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන දත්ත ඇතුලත් Excel Sheet පදනම් කරගෙන සමෘද්ධි බැංකු වෙත මුදල් ප්‍රේෂණය කිරීම. හා සමෘද්ධි බැංකු විසින් ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම්වලට වාරික මුදල් බැර කිරීම | සෑම මසකම තුන්වන සතිය තුල |

06. සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට දායක මුදල් නොලැබෙන තත්වයක් මත වුවද, අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ උසස් අධ්‍යාපනය බිඳවැටීමට ඉඩ නොදී ද්විතීක අධ්‍යාපනය වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව සිදු කරනු ලබන මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ, (ක්ෂුද්‍ර මූල්‍ය), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
3. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස./දැ.ගැ.ස.